# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - ඌව පළාත

DEPARTMENT OF HEALTH SERVICES - UVA PROVINCE

சுகாதார சேவைத் திணைக்களம் - ஊவா மாகாணம்

අංක 301 ආර් එච් ගුණවර්ධන මාවත - බදුල්ල # 301 R.H. Gunawaradana Mawatha Baudlla.


මගේ අංකය My No. UH/EC/වා.ස්.මා./2027 ඔබේ අංකය Your No. ........................................ දිනය Date 2026.09. 08

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
බදුල්ල/මොනරාගල,

වෛද්‍ය අධිකාරි,
මූලික රෝහල,
දියතලාව,වැලිමඩ,මහියංගණය, බණ්ඩාරවෙල
වැල්ලවාය. සියඹලාණ්ඩුව, බිබිල.

සියළුම ආයතන ප්‍රධානීන් වෙත

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු - 2027 වර්ෂය</u>**

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළුම සෞඛ්‍ය ආයතන වල සේවයේ නියුතු, 2027 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලැබූ පහත සඳහන් තනතුරු වලට අදාළ සියළුම නිලධාරින් සහ සේවක මහත්ම මත්මින්ගෙන් ස්ථානු මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

- මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි
- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී
- සෞඛ්‍ය රියදුරු සේවය
- PL කාණ්ඩයේ සියළුම තනතුරු ( PL- I, PL – II, PL – III)

02. ඒ අනුව, වත්මන් තනතුරට අදාළව 2026.12.31 දිනට එකම සේවා ස්ථානයක වසර 05 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම නිලධාරින් හා සේවක මහත්ම මහත්මින් සහ සේවා ස්ථානයක වසර 2 ත් වසර 5 ත් අතර සේවා කාලයක් ඇති ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරින් හා සේවක මහත්ම මහත්මින් මේ සමග එවා ඇති ඇමුණුම 01 හි සඳහන් ස්ථාන මාරු ලබා දීමේදී සලකා බලනු ලබන පොදු කොන්දේසි සැලකිල්ලට ගනිමින් 2027 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීමට නිලධරයන් දැනුවත් කළ යුතුවේ.

03. 2027 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලැබූ සියළුම නිලධාරින් සහ සේවක මහත්ම මහත්මින් 2026.09.30 දිනට පෙර ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතු අතර, මෙවර ස්ථාන මාරු අයදුම් කිරිම මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදු කෙරේ.

04. ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.up.gov.lk යන වෙබ් අඩවියට පිවිස මෙම සබැඳිය (Link) https://healthdept.up.gov.lk/annual-transfers/ භාවිතා කර ස්ථාන මාරු අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කර, එසේ සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ආයතන ප්‍රධානි සහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව මා වෙත යොමු කළ යුතුවේ.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබූ, එහෙත් එම නියෝග ක්‍රියාත්මක නොවූ නිලධරයන් 2027 වර්ෂය සඳහා ස්ථාන මාරු අයදුම් කළ යුතු අතර, එසේ ඔවුන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක නොවූයේ අනුප්‍රාප්තිකයෙකු නොමැති හෙයින් නම් **පමණක්** ස්ථාන මාරු මණ්ඩලයේ දි ඒ සම්බන්ධව සලකා බැලීම සඳහා, හේතු සඳහන් ලිපියක් ආයතන ප්‍රධානිගේ නිර්දේශය සහිතව ස්ථාන මාරු අයදුම්පත සමග අමුණා එවන ලෙස දන්වා සිටිමි.


**Telephone Numbers :** General : 055-2223098
Fax : 055-2223098
Accountant : 055-2231981 Administrative Officer : 055-2229694

**Email :**
Planning Unit : pdhsplanning@gmail.com
Administrative Branch : uvaprovince.pdhs2020@gmail.com
Accounts Branch : pdhsuvaacc@gmail.com

06. තවද 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඇතුළත්වන නිලධරයන් විසින් ඉටු කරනු ලබන රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ඔබ ආයතනයේ සේවයේ නියුතු පළපුරුදු නිලධරයන් පුහුණු කර ගැනීම ආයතන ප්‍රධානීන් සතු අනිවාර්යය වගකීමක් වන බව සඳහන් කරන අතර, 2027 ස්ථාන මාරු නියෝග ලබන නිලධාරින් සේවා අවශ්‍යතාවය මත තවදුරටත් රඳවා ගැනීමට ඉල්ලුම් කිරිමෙන් වළකින ලෙසත් ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කරන අය සේවා අවශ්‍යතාවය අනුව පළාත තුළ ඕනෑම සේවා ස්ථානයක සේවය සඳහා යෙදවීමට සිදුවන බවත් අවධාරණය කරමි.

07. එසේම අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ස්ථාන මාරු කිරීම සඳහා සලකා නොලබනු බවත්, අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධයෙන් ඇමුණුම් අංක 01 හි සඳහන් 02 වගන්තිය අනුව කටයුතු කරනු ලබන බවත් දැනුම් දෙමි. එබැවින් අයදුම්පත් යොමු කරනු ලබන නිලධරයන් වෙත ඒ පිළිබඳව දැනුවත් කරන ලෙස දන්වමි.

විශේෂඥ වෛද්‍ය
ඩබ්ලිව්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න
MBBS.MSC,MD Medical Adiministration
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්.මහේන්ද්‍ර සෙනෙවිරත්න
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත්

ඌව පළාත් සෞඛ්‍ය ලේකම් - කා.දැ.ගැ.ස.

**වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා පොදු කොන්දේසි - 2027 වර්ෂය වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරනු ලබන නිලධරයන් 2026 දෙසැම්බර් 31 දින වනවිට පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

01. ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සෞඛ්‍ය ආයතනයක අදාළ තනතුරේ වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, ස්ථාන මාරු අයදුම්පත් කැඳවා ඇති සේවාවල සියළුම නිලධරයන් ස්ථාන මාරුවීම් වලට අනිවාර්යයෙන්ම යටත් වේ. වසර 5 ට වැඩි සියළු නිලධරයන්ගේ තොරතුරු යොමු කර ඇති බවට ආයතන ප්‍රධානි විසින් වගකීමට බැඳේ.

02. එසේ වසර 05ක සේවා කාලය සම්පූර්ණ කර තිබියදීත් පරිදි අයදුම්පත් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී ස්ථාන මාරු නියෝග මගින් ලබා දෙනු ලබන සේවා ස්ථානයක් වෙත නිලධරයන් වාර්තා කළ යුතුය. එවැනි අවස්ථාවල අභියාචනා සලකා බලනු නොලැබේ.සේවා කාලය ගණනය කිරීමේදී එකම සෞඛ්‍ය ආයතනයක් තුළ අඛණ්ඩව සේවය කළ කාලය මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ . (තාවකාලික අනුයුක්ත ලබා සිටි කාලසීමාවන් නොසලකා හැරේ)

03. ස්ථාන මාරු සඳහා ජ්‍යෙෂ්ඨත්වය සලකනු ලබන්නේ වර්තමාන තනතුරට පත්වූ දිනයයි.

04. ඔබ විසින් අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේදි ස්ථාන මාරුවීමට අපේක්ෂා කරන ස්ථාන 10 ම අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය. එසේ නොවන්නේ නම් ස්ථාන මාරු මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබේ.

05. ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ, එම සේවා ස්ථාන වලට දුෂ්කර සේවා ස්ථාන වල සේවය කරන නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

06. එකම ආයතනයක පිහිටි අංශ අතර ස්ථාන මාරු ඉල්ලීම් වලදි එම ආයතනය සඳහා ඉල්ලුම් කර ඇති බාහිර ආයතන වලින් ලැබී ඇති ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

07. දැනට සේවය කරන සේවා ස්ථානයේම සේවය කිරීමට අපේක්ෂා කරන්නේ නම් එම සේවා ස්ථානය ඉල්ලුම් කිරීමට හැකියාවක් පවතින අතර ඔබ විසින් ස්ථාන මාරුවීමට අපේක්ෂා කරන ස්ථාන 10 ම නම් කිරීම අනිවාර්යය වන අතර එහි වගකීම අදාළ නිලධරයන් විසින්ම දැරිය යුතුය.

08. ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කරන ඕනෑම නිලධරයකු තමන් සේවය කරන එකම සේවා ස්ථානයේ අදාළ තනතුරේ අවම වශයෙන් වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

09. කිසියම් නිලධාරියෙකු ස්ථාන මාරුවලට යටත් වුවද, ස්වකීය වර්තමාන සේවා ස්ථානයේම සේවය කිරීමට ඇති අපේක්ෂාවෙන් ඉල්ලුම්පත් යොමු කළ ද, එම සේවා ස්ථානයට වෙනත් නිලධාරියෙකු ස්ථාන මාරු අයදුම් කර තිබේ නම්, එම ස්ථාන මාරුව ක්‍රියාත්මක කර, ස්ථාන මාරු අපේක්ෂා නොකරන නිලධාරියාව වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කරනු ඇත.

10. අභියාචනා මත අනුයුක්ත කර ඇති නිලධරයන් සම්බන්ධව සේවා කාලය ගණනය කිරීමේදී අනුයුක්ත ස්ථානයේ සේවා කාලය ස්ථිර සේවා ස්ථානයේ සේවා කාලය සේ සලකා කටයුතු කරනු ලැබේ.

11. ආබාධිත දරුවන්, දීර්ඝකාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සිටින නිලධරයන්ට මුහුණදීමට සිදු වන විසඳා ගත නොහැකි ගැටළු වැනි පිළිගත හැකි කරුණු සහිතව තම ආයතන ප්‍රධානියාගේ / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශයන් ද සමඟ ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සලකා බැලිය හැකිය.

12. ස්ථාන මාරු සඳහා එවනු ලබන අයදුම්පත්‍ර www.healthdept.up.gov.lk යන වෙබ් අඩවියෙහි ඇතුලත් https://healthdept.up.gov.lk/annual-transfers/ සබැඳිය )Link) භාවිතා කර මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පතේ මුද්‍රිත පිටපත විය යුතු අතර, එය ආයතන ප්‍රධානියාගේ / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

13. ස්ථාන මාරු සඳහා අදාළ වන උපරිම වයස් සීමාව අවුරුදු 57කි. එසේ වුවත් නිලධරයන්ගේ ඉල්ලීම මත අවුරුදු 57න් ඔබ්බට වුවද ස්ථාන මාරු සිදු කළ හැකිය.

විශේෂඥ වෛද්‍ය
ඩබ්ලිව්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න
MBBS.MSC,MD Medical Adiministration
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්.මහේන්ද්‍ර සෙනෙවිරත්න
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත්

ඌව පළාත් සෞඛ්‍ය ලේකම් - කා.දැ.ගැ.ස.